# A STUDY ON THE USE OF KOHA SYSTEMS IN THE LIBRARY OF THE UNIVERSITY OF KELANIYA, SRI LANKA

**Peiris, W.D.G.**
Library and Information Science, University of Kelaniya, Sri Lanka
peiris.dinigayanthi@gmail.com

21 වන සියවසේ තාක්ෂණික විප්ලවය සමඟ, විශ්වවිද්‍යාල පුස්තකාලවල සේවා සැපයීමේ ක්‍රමයන් ද ඩිජිටල්කරණයට යොමු වී තිබේ. KOHA යන පුස්තකාල කළමනාකරණ පද්ධතිය, ශ්‍රී ලංකාවේ විශ්වවිද්‍යාල පුස්තකාල තුළ භාවිතා කරමින් පවතී. මෙම පද්ධතිය පුස්තකාල කටයුතු ස්වයංක්‍රීය කිරීම, දත්ත කළමනාකරණය, පරිශීලක සපුරාලීම් සහ OPAC සේවාවන් සපයන දී ප්‍රධාන භූමිකාවක් ඉටු කරයි. මෙම පර්යේෂණයේ අරමුණ වන්නේ කැලණිය විශ්වවිද්‍යාලයේ KOHA පද්ධතිය භාවිතයෙන් සිදුවන කාර්යක්ෂමතාවය, පුස්තකාල සේවකයන් සහ පරිශීලකයන්ගේ ප්‍රතිචාර සහ එය වැඩිදියුණු කළ හැකි ක්‍රම පිළිබඳ විග්‍රහයක් ඉදිරිපත් කිරීමයි. මෙම පර්යේෂණය සඳහා සංයුක්ත පර්යේෂණ ක්‍රමවේදයක් (Mixedmethod) භාවිතා කරන අතර, ගූගල් පෝරමයක් භාවිතයෙන් උපාධි සිසුන්ගේ දත්ත රැස් කරන ලදී. ඊට අමතරව ප්‍රාථමික සහ ගුණාත්මක දත්ත රැස් කිරීම සඳහා පුස්තකාල සේවකයන් සහ අධ්‍යයන මණ්ඩල සාමාජිකයන් අතරින් ප්‍රශ්නෝත්තර හා සම්මුඛ සාකච්ඡා සිදු කෙරිණි. KOHA පද්ධතියේ කාර්යක්ෂමතාවය මැනීමට යොදාගත් ප්‍රධාන සාධක ලෙස පද්ධති ප්‍රතිචාර වේගය, OPAC පහසුකම්, ලේඛන ලියාපදිංචිය, පරිශීලක අතුරුමුහුණත්, සහ පුස්තකාල සේවක පුහුණු මට්ටම ඇතුළත් වේ. KOHA පද්ධතිය මගින් ලේඛන කළමනාකරණ කාර්යයන් වේගවත් වීම, දොෂ් අඩු වීම, හා තාක්ෂණික පුහුණු හිඟය, පද්ධති යාවත්කාලීන කිරීමේ දුබලතා, සහ පරිශීලක සීමිත දැනුවත්භාවය හේතුවෙන් එහි කාර්යක්ෂමතාව සීමාවකට ලක් වී ඇති බව අනාවරණය විය. KOHA පද්ධතිය තාක්ෂණික වශයෙන් දියුණු වුවද, පරිශීලකයන් සඳහා පුහුණු වැඩසටහන්, භාවිතා උපදෙස්, සහ තාක්ෂණික මාර්ගෝපදේශන කෙරෙහි අවධානය යොමු කිරීම අත්‍යවශ්‍යය වේ. විශේෂයෙන්ම විශ්වවිද්‍යාල පුස්තකාලවල දී පද්ධතිය නිසි පරිදි භාවිත කිරීමට පුස්තකාල හා විද්‍යාපන විද්‍යා පාඨමාලා හා වැඩි දියුණු කිරීම අවශ්‍ය වේ. KOHA පද්ධතියේ භාවිතය සඳහා තාක්ෂණික පුහුණු වැඩසටහන්, සහ ආයතනික ආධාර වැඩි කිරීම නිර්දේශ වේ.

**මුඛ්‍ය පද :** *තාක්ෂණික විප්ලවය, විශ්වවිද්‍යාල පුස්තකාල, පුස්තකාල කළමනාකරණ පද්ධතිය, පරිශීලක අතුරුමුහුණත්, KOHA*